චක්‍රලේඛ අංක:- 07/2004

මගේ අංකය:- බප/සසේකො/ලේ/නිර්
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක 50, නිඳැල්වත්ත පාර,
කොළඹ 08.
2004.12.27

බස්නාහිර පළාතේ, සියලුම සමූපකාර සමිති,
සභාපතිවරුන් වෙත,

මහත්මයාණෙනි,

## ප්‍රසූති නිවාඩු - කාර්ය විධිවිධාන සංග්‍රහයේ 2:7 පරිච්ඡේදය

2004.08.18 දිනැ'ති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2004 පරිදි රජයේ නිලධාරීන්ට සෑම දරු උපතක් සඳහාම දින 84 ක ප්‍රසූති නිවාඩු 2004.06.23 දින සිට ලබා දීමට තීරණය කර ඇත. එකී තීරණය සමූපකාර සේවකයින් සඳහා ද අදාළ කර ගැනීමට බ.ප. සමූපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින්, සමූපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 2 වන පරිච්ඡේදයේ 2:7 උප ඡේදයේ සඳහන් වගන්ති වෙනුවට පහත සඳහන් වගන්ති 2004.09.01 වන දින සිට බල පැවැත්වෙන පරිදි ආදේශ කරනු ලැබේ.

**2:7 ප්‍රසූත නිවාඩු**

2:7:1 සමූපකාර සේවිකාවකට සෑම සජීවී දරු උපතක් සඳහාම වැඩ කරන දින 84 ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමි වේ. මෙම වගන්තිය යටතේ නිවාඩු ලබා ගැනීම සඳහා වෛද්‍ය සහතිකයක් හෝ දරුවාගේ උප්පැන්න සහතිකය හෝ ඉදිරිපත් කළ යුතු ය.

2:7:2 ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී සේවිකාවන්ට මෙම වගන්ති යටතේ ප්‍රසූත නිවාඩු හිමි වේ.

2:7:3 ප්‍රසූත නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුලට පැමිණෙන වෙළඳ නිවාඩු, සති අන්ත නිවාඩු හෝ එම සති අන්ත නිවාඩු දින වෙනුවට ආදේශ කර ගන්නා නිවාඩු දිනයන් ප්‍රසූත නිවාඩු දිනයන්ට ඇතුලත් නොකළ යුතුය.

2:7:4 මෙම නිවාඩු කාලය සමූපකාර සේවිකාවන්ගේ ඉතිරිව තිබෙන නිවාඩුවලින් අඩු නොකළ යුතු අතර, මෙම නිවාඩු කාලය සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලෙසට සැලකිය යුතුය.

2:7:5 උපතේදීම මරණය සිදුවන දරු උපතකදී සහ දරු ප්‍රසූතියෙන් සති 6 ඉක්ම යාමට මත්තෙන් දරුවා මරණයට පත්වන අවස්ථාවකදී දරුවා ගේ මරණ සහතිකය හෝ වෛද්‍ය සහතිකය හෝ ඉදිරිපත් කළ විට විශේෂ වැටුප් සහිත නිවාඩු වශයෙන් දරු උපත සිදුවූ දින සිට සති 6 ක නිවාඩුවක් දිය යුතු ය.

2:7:6 ගබ්සාවක් නිසා නිවාඩු, වෛද්‍ය සහතිකයක් මත සේවිකාවකට හිමි විවේක නිවාඩු වලින් ලබා ගත යුතු.

2:7:7 අනුමත දින 84 ක ප්‍රසූති නිවාඩු කාලය අවසන් වීමෙන් අනතුරුව තම දරුවාට මව් කිරි දීම සඳහා සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැයකට කලින් සේවා ස්ථානයෙන් පිටත්ව යාමට ඔවුනට අවසර දිය යුතුය. මෙම අවසරය දිය යුත්තේ දරුවාට මාස 6 ක්(හයක්) සම්පූර්ණ වනතුරු පමණී.

තවද, සේවිකාවකට ගර්භනී අවස්ථාව මාස 5 ක් වූ විට රාජකාරි සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාදවී පැමිණීමට ද සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැය භාගයකට ප්‍රථම පිටවීමට ද ඉඩ දෙනු ලැබේ. මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ සේවිකාව ප්‍රසූති නිවාඩු ලබාගන්නා තෙක් පමණී.

2:7:8 වැටුප් රහිත ප්‍රසූත (විශේෂ) නිවාඩු

සමූපකාර සේවිකාවකට 2.7.1 උප වගන්තිය යටතේ අනුමත කරන ලද නිවාඩු අවසන්වීමෙන් පසු මෙහි (අ) සහ (ආ) සඳහන් කරුණු සම්පූර්ණ වන අවස්ථාවලදී ඇයගේ සේවා කාලය තුළ දරු උපතකට උපරිම වශයෙන් මාස 06 ක කාලයක වැටුප් රහිත ප්‍රසූත (විශේෂ) නිවාඩු ලබා දිය හැකි ය.

(අ) උපතේදීම දරුවා අසාමාන්‍ය තත්ත්වයක සිටි බව ප්‍රසව හා නාරි රෝග පිළිබඳව රජයේ වෛද්‍ය විශේෂඥයකු සහතික කොට ඇත්නම්, එවැනි දරුවක් සම්බන්ධව ලබා ගත් සාමාන්‍ය ප්‍රසූත නිවාඩු අවසන් වන අවස්ථාවකදී එම ළදරුවා තවදුරටත් අසාමාන්‍ය තත්ත්වයක පිටින බව හා ඒ නිසා මවගේ විශේෂ පෞද්ගලික අවධානය එම දරුවාට තවදුරටත් අවශ්‍ය බව රජයේ ළමා රෝග වෛද්‍ය විශේෂඥයකු සහතික කරන අවස්ථාවක

(ආ) දරුවාගේ උපත නිසා වෙනත් රෝගාබාධ ඇතිවීමේ හේතුවෙන් මවට තවදුරටත් විවේකය අවශ්‍ය වන බව ප්‍රසව හා නාරි රෝග පිළිබඳව රජයේ විශේෂඥ වෛද්‍යවරයකු සහතික කරනු ලබන අවස්ථාවක.

02. මේ අනුව කාර්ය විධිවිධාන සංග්‍රහයේ 2:7·2 වගන්තිය සංශෝධනය කරය අනු මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ/සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්වරයා ගේ එකඟත්වය ඇතිව ය. (බ.ප.)

03. මෙම චක්‍රලේඛය සමිතියේ සියලුම සේවකයන් ගේ දැනගැනීමට සලස්වන්න.

මෙයට,
විශ්වාසී,

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර, පළාත් මාර්ග හා විදුලි බල අමාත්‍ය තුමා ගේ සම්බන්ධීකරණ නිලධාරී
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම් – සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යාංශය(බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ, කළුතර, ගම්පහ )
6. ලේකම් – සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වාණිජ්‍ය සමිති සංගම්